මා නිදගත්තේ ඉස්තෝප්පු කාමරයේ ය. එය අප එකල වාසය කළ තාත්තාගේ මහ ගෙදර ප්‍රධාන කොටසින් වෙන්වී තිබුණි. ඉස්තෝප්පු කාමරයේ දෙර ද, තිවසේ ප්‍රධාන කොටසට ඇතුළු වීමට තිබූ දෙරවල් දෙක ම ද විවර වූයේ එකම ඉස්තෝප්පුවටයි. මේ ඉස්තෝප්පු කාමරයේ තිබූ එකම ඇඳේ මාත් මල්ලීත් දෙදෙනාම නිද ගතිමු.

එදා අද ලංකාවේ මෙන් රාත්‍රියට ඇඟ රිදවන දහයක් නොතිබුණි. අද මෙන් මඳුරු උවුදුරක් ද නොතිබුණි. "ග්ලෝබල් වෝමිං", "එන්සෙපලයිටිස්", "ඩෙංගි" යන වචන අප ඇසූයේ මීට දශකයකටත් වඩා පසුව ය. මඳුරු දැල් ද, ඒ දැලට කොටු වූ විට ඇතිවන සරතැස නිවා ගැනීමට අවැසි විදුලි පංකා ද භාවිතා නොකර සුවසේ නිද ගැනීමට එතිසා අපට හැකි විය. ඇත්තටම කිවහොත් විදුලි පංකා භාවිතය සඳහා අපේ නිවසේ විදුලි බලය ද නොතිබුණි.

ඒ සමගම සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ, කුඩා ලොකු අප සියළු දෙනාම එකල නිදගත්තේ පොරවන රෙදි ද සහිතව බවය. මේ ගත සිත නලවන සීතල කඳුකරයේ නොවේ. සාමාන්‍යයෙන් ග්‍රීෂ්ම දේශගුණයක් ඇති කොළඹ නගරයේ සිට සැතපුම් පහලොවක් ඇතුළත පිහිටි ගමක බව ද කිව මනාය.

මේ කරුණ සිහියේ තිබෙන තුරු, ගෝලීය උණුසුම් වීම ගැන මට වෙන සාක්ෂියක් අවශ්‍ය නොවනු ඇත.

මේ අපේ තාත්තා ගේ මහ ගෙදරයි. සීයා මියගිය පසු ආච්චි තනිවුනු නිසා, අප එවකට සිටි කුලී නිවසින් නික්මී පසුව මහගෙදර අසලින් නිවසක් තනා ගැනීමේ බලාපොරොත්තුව ඇතුව තාත්තා ගමට ආ දිනයේ, අපේ පවුලට මහ ගෙදර කාමර වෙන් කර ගැනීමේ ගැටළුව ඇතිවිය.
අප මහ ගෙදරින් පිටත්වුනේ කුඩා දරුවන් ලෙසයි. එකල අපේ වාසභවන වූයේ නිවසේ සොළ්දරයයි. දැන් ගැටවරයින් වී සිටි මල්ලීටත් මටත් මෙවර නිවසේ ප්‍රධාන කොටසින් වෙන්ව, ඉස්තෝප්පුවෙන් ඇතුළු වීමට සාදූ තිබූ, පෙරකී කුඩා ඉස්තෝප්පු කාමරය හිමිවිය.

අපේ මේ කාමරය තුල ලී බඩු තැබීම සඳහා ක්‍රම දෙකක් යෝජනා වුණි. ඉන් පළමු වැන්න නම් කාමරයේ කුඩා ඇඳුන් දෙකක් සහ ඒ මැද්දෙන් අමාරුවෙන් හෝ කුඩා කණාප්පුවක් පමණක් තැබීමයි. එවිට අපට පාඩම් වැඩ කිරීමට නිවසේ ප්‍රධාන කොටසේ සාලයට යාමට සිදුවෙනු ඇත. දෙවන යෝජනාව නම් එක් ඇඳක් සහ ලියන මේස දෙකක් සහ පුටු දෙකක් තැබීමයි.

මල්ලීත් මමත් මේ දෙවන සැකසුමට කැමති විමු. තමන් ගේ ම ලියන මේසයක හිමිකම ඇති සුඛෝපභෝගී අධ්‍යාපනික ජීවිතයක් වෙනුවෙන් අප දෙදෙනාට එකම ඇඳක නිද ගැනීමේ දුක්ඛදායක වූ වන්දිය ගෙන්නට සිදුවිය.

මේ ඇඳ සාමාන්‍ය ප්‍රමාණයේ කොට්ටා දෙකක් පළල එකකි. බිත්තියට හේත්තු වූ පැත්ත මල්ලීට හිමි වූ අතර ජ්‍යෙෂ්ඨත්වය මතදෝ මට ක්ෂණයෙන් ඇඳෙන් නැගිටීමට හැකි හොඳ පැත්ත හිමිවිය.
අපේ ඇඳ පිළිබඳව පැවසිය හැකි රසවත් කතා රාශියෙකි. එවායින් මුලින් ම මා සිතට නැගෙන්නේ ඇඳ හරි මැදින් දිග අතට සරල රේඛීයව විහිදුණු දේශ සීමාවයි. මේ රේඛාවෙන් ඇඳේ භෞමික අඛණ්ඩතාවය සුනේ සුන් වී මල්ලි ගේ ගේ ස්වයං රාජ්‍යයෙන් මගේ ස්වයං රාජ්‍යය එකිනෙකින් වෙන් විය.

ඇත්තටම කියනවා නම් මේ දේශ සීමාව නිකම්ම නිකම් ඉරක් පමණක් නොවිය. ඒ දෙපස සටන් විමුක්ත කලාපයක් ද විය. ඒ හරහා අතකින්, කකුලකින්, වැළමිටකින් හෝ අඩු තරමේන් ඇඟිල්ලකින් වුවද අතවසර අපවරණයක් වුවහොත් මහා සංග්‍රාමයක් වුවද ඇවිලී යන්නට ඉඩ තිබුණි.

ඒ දිනවල බහුලව පාවිච්චි වූයේ කොහු පිරවූ මෙට්ටයි. සියෙස්ටා ආදී රබර් සහිත වඩා සුව පහසු මෙට්ට තිබුණද, ඒවා අපේ ක්‍රය ශක්ති සීමාවෙන් ඔබ්බෙ වූ සුඛෝපභෝගී පාරිභෝගික භාණ්ඩ විය. මේ කොහු මෙට්ට වනාහි ගෝති රෙදි වලින් මසා, වේලා ගත් කොහු පිරවූ ඒවා විය. මෙට්ටයේ කොන් යැයි හැඳින්විය හැකි දර කිහිපයක් තිබුණි. සමහර මෙට්ට ඇතුළේ කොහු ගුලි වී තිබුණු අතර අතර මෙනිසා මේ මෙට්ට සාමාන්‍යයෙන් වල ගොඩැලි වලින් පිරි තිබුණි.

තරුණියක් සැබෑ කුමාරිකාවක් දැයි තෝරා ගැනීමට මෙට්ටයේ බෝංචි ඇටයක් හැංගූ කතන්දරය තේරුම් ගැනීම මේ ආකාරයේ

# කම්මැලි මකුණෝ

ද භාවිතා නොකර සුවසේ නිද ගැනීමට එතිසා අපට හැකි විය. ඇත්තටම කිවහොත් විදුලි පංකා භාවිතය සඳහා අපේ නිවසේ විදුලි බලය ද නොතිබුණි.

ඒ සමගම සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ, කුඩා ලොකු අප සියළු දෙනාම එකල නිදගත්තේ පොරවන රෙදි ද සහිතව බවය. මේ ගත සිත නලවන සීතල කඳුකරයේ නොවේ. සාමාන්‍යයෙන් ග්‍රීෂ්ම දේශගුණයක් ඇති කොළඹ නගරයේ සිට සැතපුම් පහලොවක් ඇතුළත පිහිටි ගමක බව ද කිව මනාය.

මේ කරුණ සිහියේ තිබෙන තුරු, ගෝලීය උණුසුම් වීම ගැන මට වෙන සාක්ෂියක් අවශ්‍ය නොවනු ඇත.

මේ අපේ තාත්තා ගේ මහ ගෙදරයි. සීයා මියගිය පසු ආච්චි තනිවුනු නිසා, අප එවකට සිටි කුලී නිවසින් නික්මී පසුව මහගෙදර අසලින් නිවසක් තනා ගැනීමේ බලාපොරොත්තුව ඇතුව තාත්තා ගමට ආ දිනයේ, අපේ පවුලට මහ ගෙදර කාමර වෙන් කර ගැනීමේ ගැටළුව ඇතිවිය.
අප මහ ගෙදරින් පිටත්වුනේ කුඩා දරුවන් ලෙසයි. එකල අපේ වාසභවන වූයේ නිවසේ සොළ්දරයයි. දැන් ගැටවරයින් වී සිටි මල්ලීටත් මටත් මෙවර නිවසේ ප්‍රධාන කොටසින් වෙන්ව, ඉස්තෝප්පුවෙන් ඇතුළු වීමට සාදූ තිබූ, පෙරකී කුඩා ඉස්තෝප්පු කාමරය හිමිවිය.

අපේ මේ කාමරය තුල ලී බඩු තැබීම සඳහා ක්‍රම දෙකක් යෝජනා වුණි. ඉන් පළමු වැන්න නම් කාමරයේ කුඩා ඇඳුන් දෙකක් සහ ඒ මැද්දෙන් අමාරුවෙන් හෝ කුඩා කණාප්පුවක් පමණක් තැබීමයි. එවිට අපට පාඩම් වැඩ කිරීමට නිවසේ ප්‍රධාන කොටසේ සාලයට යාමට සිදුවෙනු ඇත. දෙවන යෝජනාව නම් එක් ඇඳක් සහ ලියන මේස දෙකක් සහ පුටු දෙකක් තැබීමයි.

මල්ලීත් මමත් මේ දෙවන සැකසුමට කැමති විමු. තමන් ගේ ම ලියන මේසයක හිමිකම ඇති සුඛෝපභෝගී අධ්‍යාපනික ජීවිතයක් වෙනුවෙන් අප දෙදෙනාට එකම ඇඳක නිද ගැනීමේ දුක්ඛදායක වූ වන්දිය ගෙන්නට සිදුවිය.

මේ ඇඳ සාමාන්‍ය ප්‍රමාණයේ කොට්ටා දෙකක් පළල එකකි. බිත්තියට හේත්තු වූ පැත්ත මල්ලීට හිමි වූ අතර ජ්‍යෙෂ්ඨත්වය මතදෝ මට ක්ෂණයෙන් ඇඳෙන් නැගිටීමට හැකි හොඳ පැත්ත හිමිවිය.
අපේ ඇඳ පිළිබඳව පැවසිය හැකි රසවත් කතා රාශියෙකි. එවායින් මුලින් ම මා සිතට නැගෙන්නේ ඇඳ හරි මැදින් දිග අතට සරල රේඛීයව විහිදුණු දේශ සීමාවයි. මේ රේඛාවෙන් ඇඳේ භෞමික අඛණ්ඩතාවය සුනේ සුන් වී මල්ලි ගේ ගේ ස්වයං රාජ්‍යයෙන් මගේ ස්වයං රාජ්‍යය එකිනෙකින් වෙන් විය.

ඇත්තටම කියනවා නම් මේ දේශ සීමාව නිකම්ම නිකම් ඉරක් පමණක් නොවිය. ඒ දෙපස සටන් විමුක්ත කලාපයක් ද විය. ඒ හරහා අතකින්, කකුලකින්, වැළමිටකින් හෝ අඩු තරමේන් ඇඟිල්ලකින් වුවද අතවසර අපවරණයක් වුවහොත් මහා සංග්‍රාමයක් වුවද ඇවිලී යන්නට ඉඩ තිබුණි.

මෙට්ටවල නිදගත් අප බොහෝ දෙනෙකුට අපහසු වීම වටහාගත හැකි කරුණකි.

මෙට්ට වලගොඩැල්ලෙන් පිරි තිබීම නිසා සිදුවන මාංශ ජේඹි රිදීමට අමතරව, අඳ ඇතිරිල්ල තුලින් රිංගා එන අකීකරු කොහු උල් ඇඟී ඇඟ කැසීමට සිදුවීමද අපේ ජීවිතවල කොටසක් ම විය.
එක් දිනක්, ඇඟ කසමින් වදෙන් පොරෙන් නින්දට ගිය මා, දෑසෙන් වැගිරෙන නිදිමත දහරා පිසදමමින් මැදියම අවදිවූයේ මල්ලි ගේ කට හඬිණි.

ඔහු විදුලි පන්දමක් දල්වා ගෙන මෙට්ටයේ මොනවාදෝ සොයයි.

මේ වන විට මල්ලි සොයා ගෙන තිබුණේ අපූරු කරුණකි. අපේ මෙට්ටයේ ඇති දර පුරා මකුණෝ පිරි ඉතිරි යමින් සිටියහ. වසර කිහිපයකට පෙර සමූපකාරයක පාන් පිටි පෝලිමක මෙන් පොදි කමින් එහි රැඳී සිටි මකුණන් සංඛ්‍යාව සිය ගණනක් විය.

පෙර අගනක් එක් එළු දෙනක හිස සිඳා ඇය ඇඟ ලෝම ගණනේ හිස් කැපුම් ලද

යැයි ලෝ වැඩ සගරාවේ කියවේ.

මකුණන් ඇඟ ලෝම නොතිබීම කෙතරම් හොඳදැයි මට එදින සිතුනි.

තාත්තා ද, මල්ලි ද එක්ව පැයක් පමණ ගත කර ඒ මකුණන් හමුදාව සමූල ඝාතනය කරන ලදී. මම ද නිදිමතේම වුව ඒ පුණ්‍ය කර්මයට නොසුරුවව සහය වුණෙමි.

මල්ලීත් මාත් දෙදෙනාම නිද ගැනීමද, පාඩම් කටයුතු වැඩ කිරීමද, එකම කාමරයේ සිදුකිරීමේදී ඇතිවන ප්‍රධාන අපහසුතාව නම්, එක් අයෙක් රාත්‍රී තෙල් පුච්චමින් වෙහෙසන අතර අනිකාට නිදිමත හැදුනද, බොහෝ විට ආලෝකය මැද නින්ද නොයාම හේතු කොට ගෙන නිදිමරමින් සිටීමට සිදුවීමයි.

මා මේ වන විට පාසල් ගියේ කොළඹ ආනන්ද විද්‍යාලයට නිසා හිමිදිරි පාන්දර පහ ට පමණ අවදිවිය යුතු විය. එනමුදු, උසස් පෙල පාඩම් කටයුතු අධික වූ බැවින්, වේලාසනින් නිදු ගැනීමද කළ නොහැකි විය.

මල්ලි ට මේ කරදර දෙකම නොතිබුණි. එතිසාම දෝ හැකි ඉක්මණින් නිදු ගැනීම ඔහුගේ පුරුද්ද විය. නමුත්, උදෑසන මා අවදිවී ඇඳ පැළඳ ගන්නා විට අතිවාර්‍යයෙන්ම ඔහු ගේ නින්ද කැඩේ. අපේ මෙට්ට රාජධානියේ සිටි මකුණන් බර අවි නොයොදම සමූල ඝාතනය වී තිබුණු හෙයින් හොඳ නින්දක් සඳහා මල්ලීට තිබුණු එකම බාධකය වූයේ මා පාඩම් කිරීම සඳහා දල්වාගෙන සිටින චිමණි ලාම්පුවයි.
ලාම්පුව නිවෙන්නේ මගේ පාඩම් වැඩ අවසාන කර මා ඇඳට යන වෙලාවේදීය. මා ඒ සඳහා යොමු කිරීමට මල්ලි අනුගමනය කලේ අපූරු උපක්‍රමයකි.

කා, බී, දත් මැද, කකුල් සෝද ගන්නා ඔහු ඇඳට යන්නේම, "හරිම කම්මැලියි නේද? අද නං හරිම සීතල දවසක්, හොඳට පොරවං ගුලිවෙලා නිදගන්න ඕනෑ!" යයි කියමිනි.

එතැන් පටන් ඔහු ඇඳේ සිට මෙවැනි ප්‍රචාරක පාඨ රැසක් ඇඳ බායි. මහ හඬින් ඇඳනුම් හරියි. ඒ සියල්ල අවසාන වන්නේ නොදැනුවත්වම වගේ ඔහු නින්දට වැටීමෙනි. අප දෙදෙනා මේ සුහද ක්‍රියාවලිය සරදම් බසින් හැඳින්වූයේ "කම්මැලි කරවීම" යනුවෙනි.

ඉඳහිට දිනක හැර, මා මල්ලිගේ මේ කම්මැලි කරවීමේ උපක්‍රමවලට නොරැවටුණු බවද කිව මනාය. එසේ වුවද, විභාගයෙන් පසු එලැඹෙන ගන්ධබ්බ සමයේ දී, එකට"එක කිරීමේ සංකල්පය යටතේ මා අනුගමනය කළ පෙර හා සමාන වූ කම්මැලි කිරීමේ ව්‍යාපෘතිය නම් තරමක් හෝ එල දැරූ බව කණගාටුවෙන් වුවද සඳහන් කළ යුතුව ඇත.
අවසාන වශයෙන්, ආනන්ද විද්‍යාලයේ මා උගත් සිව් වසරක කාලයේ අත්දැකීම් අළලා ලියවෙන මේ ලිපි මාලාවට අද පලවෙන මේ "කම්මැලි මකුණෝ" ලිපිය අළල වන්නේ කෙළෙසදැයි කිව යුතුය.

එද, තිස් දෙවසරකට පෙර දිනයක අප අතින් මිය පරලොව ගිය ඒ මකුණු රැලේ ආරම්භය නිසැකවම සිදුවන්නට ඇත්තේ මා පාසල් යාම සඳහා ගනේමුල්ලේ සිට මරදන දක්වා ගමන් කළ දුම්රියේදී මගේ කොට කලිසමේ එල්ලුණු මකුණෙක්, දෙන්නෙකු ගෙනි.

අවශ්‍ය නම් පාසල මත මට පැටවිය හැක්කේ ඒ වරද පමණක් නොවේ. මකුණු හමුදාව විනාශ කිරීමේ පාපයේ මගේ පංගුවට ද ඒ සාධාරණීකරණය කළ හැකි ය. මා එසේ නොකරන්නේ, මේ ලිපි මාලාව ලිවීම මගින් කවරෙකු ගේ හෝ සිත් රිදවන මකුණෙක් වීමේ අභිලාෂයක් මා තුල නැති බැවිණි. ■

## කාරුණික ඉල්ලීමක්

දරුවන් නොමැති කාරුණික යුවලකට දරු සම්පතක් ලබා ගැනීමට උදව් කළ හැකි පරිත්‍යාගශීලී කාන්තාවකටයි මේ ආරාධනය. ඔබ දරු සම්පත් හිමි දැනටමත් ඔබේ පවුල සම්පූර්ණ කර ඇති වයස අවු 36 ට අඩු කාන්තාවක් නම් ඔබට ඔබේ ඩිම්බ පරිත්‍යාග කිරීමෙන් මෙම යුවලගේ බලාපොරොත්තු සපුරා ගැනීමට උපකාර විය හැකි ය. කරුණාකර anne28878@gmail.com ලිපිනයට ලියන්න සියලු තොරතුරු වල රහස්‍යභාවය සුරැකේ.

ABN 399 885 48425

SRI WRECK TOWING

VEHICLE TRANSPORT
BREAKDOWNS
FREE OLD CAR REMOVALS
RELIABLE RATES
TILT TRAY TRUCK
ALL AREAS

24 hours 7 days a week

0433 495 548

udesha@bigpond.com Tel 5995 6105